www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ප්‍රකාශයක්: ලේඛක වැඩ වර්ජනය ලේඛකයන් ම මත ඇති කරන්නා වූ බලපෑම කුමක්ද?

## A comment: What will be the impact of the writers’ strike on the writers themselves?

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2008 ජනවාරි 16**

චිත්‍රපට හා රූපවාහිනී ලේඛකයෝ නොවැම්බර් 5 දා සිට වර්ජනයක යෙදී සිටිති. අන්තර් ජාලය හා අනෙකුත් නව මාධ්‍යයන් මගින් පෙන්වනු ලබන තම කෘති සඳහා සෑහෙන ගෙවීමක් ගබා ගැනීම පිනිස යෝධ චිත්‍රාගාර සහ විනෝදාස්වාදය සපයන ජාල සමග ඔවුන් ගෙනයන අරගලය කටුක එකකි.

ලේඛකයෝ ඔවුන් ඉල්ලන දෙය ලැබීමට සුදුසු වන අතර ඇත්ත වසයෙන් නම් ඔවුහු ඊටත් වඩා වැඩි දෑ ලැබීමට සුදුසු වෙති. එක්සත් ජනපදයේ සහ ලෝකයේ ජනයා බැලිය යුත්තේ හා ඇසිය යුත්තේ කුමක් දැයි තීරනය කිරීමේ සහ බහ්වාධිකාරයන් අතලොස්සක් අතට නිර්බාධිතව අති විශාල ලාභ පොට්ටනි ගලා යන බව නිශ්චය කිරීමේ භූමිකාව ඉටු කරන සංගත පරපෝෂිතයන්ගේ ස්ථරයක් චිත්‍රපට හා රූපවාහිනී ව්‍යාපාරයන් අධීක්ෂනය කරති.

එක් හෝ තවත් පාලක ස්ථරයක් පිලිබඳව බ්‍රෙෂ්ට් වරක් සඳහන් කල පරිදි, ‘සමහරවිට ඔවුහු සිටින ආකාරයෙන් සිටිනවා විය හැකිය, එහෙත් ඔවුන් ඒ සඳහා සුදුසු නො වේ.’

ලේඛක වැඩ වර්ජනය සඳහා යුක්ති සහගත හා සමාජමය වසයෙන් ප්‍රගතිශීලී වැඩපිලිවෙලක් ආරම්භ විය යුත්තේ චිත්‍රපට, රූපවාහිනී හා අනෙකුත් මාධ්‍ය නිෂ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ මාධ්‍යයන්, ජීඊ, ටයිම් වෝනර්, ඩිස්නි, නිව්ස් කෝප්, වියාකොම් සහ අනෙකුත් ඒවායේ දඬුඅඬු ග්‍රහනයෙන් මුදා හරිනු ලැබිය යුතු ය යන්න පූර්වාවයවය කොටගෙන යි. ඒ සඳහා ඩිමොක්‍රටික් පක්ෂයෙන් දේශපාලනිකව බිඳී වෙන්වීමක් ද ජාත්‍යන්තර කම්කරු පන්තියේ අරගලයන් හා සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම සමග සවිඥානිකව අනන්‍යවීමක් ද අවශ්‍ය කෙරේ.

චිත්‍රාගාර සහ ජාල ඔවුන්ගේ පැත්තනේ ලේඛකයන් පරාජය කිරීමේත් ඔවුන් තමන්ගේ සර්වබලධාරීත්වයට තර්ජනයක් යයි හඟින දෙය තීරනාත්මක ලෙස මැඩීමෙන් පසු සාමාන්‍ය තත්වය කරා ආපසු යාමේත් අපේක්ෂාවෙන් පසු වෙති. එහෙත් එය සිදු වනු හැක්කේ කෙසේද? කවර කලෙකවත් දේවල් ‘සාමාන්‍ය තත්වය’ කරා පෙරලා නො පැමිනේ. මිට්ටන් සහ තඩියන් පෙරලා එකට අසුරනු ලැබිය නො හැකි ය.

ලේඛකයෝ වැදගත් හා ඇස් අරවනසුලු අත්දැකීමක් විඳිමින් සිටිති. ලේඛකයන්ගෙන් වඩා සාර්ථක අය නිසැකව ම ආර්ථික අපහසුතාවන්ගෙන් තොරව සිටින නමුත් ඔවුන්ගෙන් බොහෝ අය එසේ නො වෙති. පඩිපත් අහිමි කර ගනිමින් පිකට් වැටවල ඇවිදින ඔවුන්ගේ බිල්පත් සහ නය ඉහල යමින් පවතී. ඇත්ත වසයෙන් ම මෙමගින් ඔවුන්ගේ පුද්ගලික සබඳතා මත පීඩනයක් ඇතිවිය හැකි ය. මේ අතරවාරයේ විශාල මුදලක් යොදවා ඔවුන්ට එරෙහිව පච ව්‍යාපාරයක් ගෙනයමින් සිටින ඔවුන්ගේ හාම්පුත්තු හිතුවක්කාරී ලෙස සාකච්ඡා ප්‍රතික්ෂේප කරති. සාරය වසයෙන් ඔවුන්ට කියනු ලබන්නේ උඹලට කෙලවෙන එක විතරයි වෙන්නේ කියා යි.

අන්තර්ජාලයෙන් ජනනය කරනු ලබන සියලු ම ධනය පාහේ යෝධ සංගත විසින් ගිලගනු ලබද්දී ලේඛකයන්ට ඕනෑවටත් වැඩියෙන් ගෙවනු ලබන නිසා ඔවුන්ට මැසිවිලි කීමට හේතුවක් නැතැයි යන කලමනාකරනයේ කියාපෑම් කුඩුකේඩු හා ආත්මාර්ථකාමී වේ. අනෙක් අතට වැඩ කරන ජනගහනයේ අනෙක් බොහෝ කොටස් සමග සසඳනවිට චිත්‍රපට හා රූපවාහිනී ලේඛකයන් වරප්‍රසාදිත ය යන්න සැඟවීමේ අවශ්‍යතාවක් නැත. මෙම වරප්‍රසාදිත භාවය ම වර්තමාන අරගලය ගෙන යාම සඳහා ඔවුන්ට ‘නිදහස ලබා දී’ ඇත.

මිලියන ගනන් එක්සත් ජනපද කම්කරුවෝ, පැයකට ඩොලර් 8, 10 හෝ 15ක් පමනක් ලැබෙන රැකියාවලට හිරවී ඊනියා කම්කරු ව්‍යාපාරය විසින් ඔවුන්ගේ ඉරනමට අතහැර දමනු ලැබ විරෝධතාව දැක්වීම සඳහා වචනයක් තෙපලීමටවත් හුස්මක් කටක් ගත නො හැකිව පසුවෙති. එම තත්වය වැඩිකල් යාමට මත්තෙන් වෙනස් වනු ඇති වුවත් වර්තමානයේ මෙම කම්කරුවෝ කෝපාග්නියෙන් කැකෑරෙමින් සිටිති.

සංගත බලය කෙරෙහි පොදු මහජන විරෝධය, ලේඛක වැඩ වර්ජනය කෙරෙහි මහජන ආකල්පය පිලිබඳ මුල්

මත විමසුම් තුල සිය ප්‍රකාශනය ලබා ගත්තේ ය. මෙවැනි මත විමසුම්වලින් දෙකක දී සමීක්ෂනයට සහභාගි වූ අයගෙන් විස්මය ජනක ලෙස අල්ප මාත්‍ර ප්‍රතිශතයක් පමනක් (එයින් එකක දී සියයට 4ක් පමනි!) විනෝදාස්වාදය සපයන සමාගම්වලට සහයෝගය පල කලහ. එවැනි දර්ශකයන්ගෙන් යමෙක් උකහා ගත යුත්තේ මාධ්‍යයන් තුල ඉදිරිපත් කෙරෙන නිර්මිත මහජන මතයට එරෙහිව එක්සත් ජනපදය තුල මහජන මතයේ සැබෑ තත්වය යි.

තමන්ගේ ම අසීරු අරගලය තුල නිමග්නව සිටින වැඩ වර්ජිත ලේඛකයෝ කම්කරු පන්තියේ අනෙකුත් කොටස් දෛනිකව ඉවසා දරාගනිමින් සිටින්නේ කුමක් ද යන්න පිලිබඳව සිතා බැලීමට වඩ වඩා යොමු විය යුතු ය. වඩා විවේචනාත්මක සහ ප්‍රඥා සම්පන්න චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන්වල වර්ධනය සඳහා එය අතිශයින් වැදගත් වනු ඇත.

ඇමරිකානු දෛනික ජීවිතයේ ගුනාත්මක භාවය කුමක් ද?

ඔබ රැකියාවක නිරත කම්කරුවෙකුනම්, අනිසි ලෙස බලය යෙදීමට, විනය නියෝග පැනවීමට හා රැකියාවෙන් දොට්ට දැමීමට නිර්බාධිත බලය සහිත බොස් කෙනෙකුට මුහුන දෙන ඔබට පලදායීත්වය සඳහා නො නවතින හඹායාමේ, උසස්වීම් ලබා ගැනීමට එකිනෙකා කපාගෙන යෙදෙන තරගයේ, එනම් සමස්තයක් ලෙස ඔබව හෙම්බත් කරන හා පරිහානියට යවන නිර්දය බලු පොරයේ වාතාවරනය තුල දවස ගෙවීමට සිදු වේ.

අර්ධ-කාලීන, තාවකාලික සහ (ලියා පදිංචි හෝ නැති) සංක්‍රමනික කම්කරුවෝ මිලියන ගනනක් එක්සත් ජනපදය තුල තථ්‍ය කාලකන්නි කොන්දේසි යටතේ වැඩ කරති. සමාජමය හා දේශපාලනික වසයෙන් ඔවුන්ට සියල්ල අහිමි කෙරී ඇත. ඔවුන්ව ගනනට ගැනෙන්නේවත් නැත. *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත මගින් පවත්වන විශේෂාංග තරග වන උටා නගරයේ පාක් සිටි හි (ඩොලර් 1,000,000කට වඩා වටිනා ගෘහ භාන්ඩ සහ විශේෂ කලා කෘති සහිත) "පාරාදීසයක කොටසක හිමිනරුවෙක් වීමට" හෝ "ඩොලර් 3,995,000ක්" පමනක් වන "ඉංග්‍රීසි ගිම්හාන නිවසක්" ෆ්ලොරිඩාවේ කැප්ටිවා ප්‍රදේශයෙන් ලබා ගැනීමට ඉහත කී කම්කරුවන්ට සුදුසුකම් නැත. ඉන් මතු නොව බොහෝ කොට ඔවුන් චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන්වලට වස්තු විෂය නො වෙති.

ප්‍රධාන ධාරාවේ සංස්කෘතිය පිලිබඳව කියතොත් රැකියා විරහිතයන්, නිවාස නොමැත්තවුන් සහ දිලිඳු නිවහන් ප්‍රදේශවල ද කුඩා ගම් හා නගරවල ද තරුනයන් පැත්ත පලාතකට වැද්ද ගනු ලබන්නේ නැත.

බොහෝ කොට ම ඇමරිකානු චිත්‍රපටවල හා රූපවාහිනී වැඩසටහන්වල ජීවිතයට සැබෑ පැවැත්ම සමග ඇත්තේ එක්සත් ජනපදයේ බොහෝ මිනිසුන් අත්දකින්නාක් මෙන් අතිශයින් ම අපැහැදිලි සම්බන්ධයකි. වෙන කිසිවකටත් වැඩියෙන් ඒවා කරන්නේ නොමග යැවීම, සැඟවීම හා ව්‍යාකුල කිරීමයි. මොන ම ආකාරයකින්වත් ඥානය ලබා දීමට, සිටින මට්ටමෙන් එසැවීමට හෝ හාස්‍යය ගෙන දීමට ඒවා අසමත් ය. මෙය ඉතා වැදගත් ය. එහි වෘත්තීය ස්ථර ද ඇතුලුව එක්ස්ත් ජනපද ජනගහනයේ සාමාන්‍ය පහත් සංස්කෘතික මට්ටම, වර්තමාන තකතීරු දේශපාලන වටාපිටාවට ද පාලක ප්‍රභුවට විපාක නො ලබා කෲරතම අපරාධයන් කිරීමට හැකිවීමට ද සාධකයකි.

ජීවිතය පිලිබඳ ව්‍යාජ හෝ පිලුනු වූ හෝ නො ගැඹුරු චිත්‍රපට විපාක ගෙන දේ. ජනගහනය තමන් දෙස ම කන්නාඩියෙන් බැලීම වලක්වන ඒවා ඔවුන්ව ඔවුන්ගේ අඩු ලුහුඬුකම් හා වැරදි දැක ගැනීමෙන් ද වලක්වයි. ඒවා මිනිසුන්ව මානව මනෝගතීන් පොහොසත් හා සියුම් අන්දමින් වටහා ගැනීමෙන් වලකයි. බලයේ සිටින්නවුන් විසින් අටවන ලද විවිධ දෘෂ්ටිවාදාත්මක හා දේශපාලනික උගුල්වලට අසුවීමට ඒවා ජනයාට උදවු කරයි.

කලාකරුවන්ව කැඳවුම් කෙරෙන්නේ ජීවිතයෙන් කුලැටි ලෙස පලායාමට නොව සර්ව පාර්ශ්වීය ලෙස එය අවබෝධ කරගැනීමේ නිරත වීමට යි. දහනව වන ශතවර්ෂයේ රුසියානු සාහිත්‍යය වේවා, 1920 ගනන්වල ජර්මානු රඟහල වේවා එක්තරා නිශ්චිත සීමාසහිත කම් සහිතව 1930 ගනන් හා 1940 ගනන්වල ඇමරිකානු චිත්‍රපට වේවා කලේ එයයි.

වර්තමාන වැඩ වර්ජනය පොදුවේ ලේඛකයන් හෝ ඔවුන'තරින් වඩා හිතන මතන කොටස් ජීවිතය සමීපයට ගෙනැවිත් තිබේද?

හෙලිදරවු කල යුතු බොහෝ අංශ එනම් බොහෝ මානව නාට්‍යයන් තිබේ. යමෙක් ඒවා දැන ගැනීමට කල යුතු වන්නේ වීදියට යාම නැතහොත් වෙලඳසැලක නැවතීම එසේත් නැතහොත් ආපන ශාලාවක සල්ලාපයක යෙදීම පමනි. දේශපාලනික හෝ සමාජමය ලිපි ද ලිවිය යුතු වුවත් ඔහු හෝ ඇය ප්‍රධාන වසයෙන් ඒවා ලිවීම අවශ්‍ය නො වේ. අතිශයින් වැදගත් මානව නාට්‍යයන් (හෝ හාස්‍ය නාට්‍යයන්) සමාජ ජීවිතය සමග බැඳී තිබේ. හුදෙක් තමන්ගේ හැකියාවන් හෝ නො සැලකිලිමත් භාවය හුවා දක්වා හිත දිනා ගැනීමට පමනක් නො පෙලඹී ලේඛකයෝ යථාර්ථය පිලිබඳ සත්‍යය පවසත් නම් ඔවුන්ට යම්කිසි ප්‍රතිපදානයක් කල හැකි වනු ඇත.

සත්‍යය පැවසීමට සමාජය, ඉතිහාසය, මානව මනෝවිද්‍යාව ආදිය පිලිබඳ ඥානය අවශ්‍ය කෙරේ.

වර්තමානයේ චිත්‍රපට හා රූපවාහිනී ලෝකයේ ඉදිරිපත් කෙරෙන බොහෝ දෑ -එනම් වෘත්තීය, ආදායම, ප්‍රසිද්ධිය, ප්‍රතිරූපය ආදිය- කාලය නාස්ති කරන හෝ ඊටත් වඩා නරක ඒවා වේ.

මෙසේ කීමේ දී විරෝධතාවන්ට මුහුන දීමට අපට සිදු වේ. 'ඔබ විනෝදය සපයන ජනප්‍රිය මාධ්‍යයකින් ඉල්ලා සිටින්නේ එයට සැපිරීමට හැකිවාට වඩා බොහෝ වැඩි දෙයකි. වෙහෙස වී නිවසට පැමිනෙන මිනිසුන්ට අවශ්‍ය වන්නේ ලෝකය පිලිබඳව සිතීමට නොව සරලව ම එහි සුවදායක නො වන තතුවලින් පලායාමටයි.' කොයි හැටියෙන් ගත්ත ද මෙය වනාහි කුතර්කයකට වැඩි යමක් නො වේ.

අයදතන 'විනෝදාස්වාද කර්මාන්තය' පිලිබඳ අපගේ මුඛ්‍ය විවේචනයන්ගෙන් එකක් වන්නේ එය කිසිදු ලෙසකින් විනෝදජනක නො වන බව යි. රූපවාහිනී ජාලයන්ගේ ප්‍රේක්ෂකයා මෙන් ම අස්ථිර බොක්ස් ඔෆීස් චරිත ද ක්‍රමයෙන් බාදනය වී යාම මේ පිලිබඳ එක් දර්ශකයකි. මාධ්‍ය බෝම්බ හෙලීම් ඉවත් කලහොත් කොතරම් නරඹන්නන් සංඛ්‍යාවක් හොලිවුඩ් නිෂ්පාදන නැරඹීමට පැමිනේ ද? ඇමරිකානු සිනමාවේ හොඳ ම දවස්වල එහි චිත්‍රපට සමග අතිනත ගෙන තිබුනු කලාත්මක භාවය බොහෝ සෙයින් ක්ෂය වී ගොසිනි.

කොයි ලෙසකින් ගත්ත ද රටෙහි අතිමහත් බහුතරය බැලිය යුත්තේ කුමක් ද යන්න තීරනය කිරීමේ තථ්‍ය ඒකාධිකාරය සතුව සිටින තැනැත්තන් තමන් ජනතාවට දෙන්නේ 'ඔවුන්ට අවශ්‍ය දේ පමනි' ය යන කියාපෑම අත්‍යන්තයෙන් ම වංක සහ නරුම වේ.

ලෝක සංස්කෘතියේ ඉතිහාසය සාක්ෂි දරන පරිදි මහජන විනෝදය සහ චින්තනය අන්‍යොන්‍ය වසයෙන් බහිෂ්කාරී නො වේ. සිතීමේ සහ හැඟීමේ නිරත මහජනයා සතුව බුද්ධියක් ද පවතී. සිද්ධීහු ද සමාජ වර්ධනයෝ ද අවම වසයෙන් අර්ධ-සවිඥානක, අර්ධ-සන්ධිමය ලෙසකින්වත් මහජන චින්තනය තුල සිය මුද්‍රාව තබා යති. නැවත වතාවක් කිව යුතුව ඇත්තේ අද්‍යතන විනෝදාස්වාද කර්මාන්තය පෙලෙන සැබෑ ප්‍රගාඪ ව්‍යාධිය වන්නේ -කලාතුරකින් දක්නට ලැබෙන ව්‍යාතිරේකයන් හැරුනු විට- මහජන ජීවිතය සමග ඇති දුරස්ථ භාවය යි.

සරලවම ජනයාට අවශ්‍ය සැබෑ ලෝකයෙන් පලායාමට ද? එය එසේනම් එය ම වෙන කිසිවක් නොව, ප්‍රථම කොටත් ප්‍රමුඛ කොටත් ජනයාට පලායාම අවශ්‍ය කරන ඉතා නීරස, ඉතා වේදනාකාරී යථාර්ථය පිලිබඳ විවේචනයකි. කවර කොන්දේසි යටතේ වුව ද විනෝදය හා නිස්කලංකත්වය ජීවිතයේ අත්‍යවශ්‍ය සංරචකයන් ය. එහෙත් යම් සමාජයක් තුල වැදගත් දේවල් පිලිබඳ සිතීම අනවශ්‍ය යයි පෘථුල පිලිගැනීමක් පවතීනම් එය වනාහි බොහෝ දෙනා හිරිවට්ටවා ඔවුන්ව අසංවේදී බවට පත්කොට ඇති සමාජය හා සංස්කෘතිය පිලිබඳ චෝදනා පත්‍රයකි. එවැනි දුෂ්කරතාවන් ජය ගනු ලැබීම කලාකරුවන්ගේ කාර්යභාරය යි- ඔවුන්ගේ කර්තව්‍යය එය හැර වෙන කුමක් ද?

කුසලතා පූර්න හා බුද්ධිමත් ජනප්‍රිය සංස්කෘතියක් මෙයින් පිටස්තර ද? එය අවබෝධ කරගැනීමට යමෙක් කල යුතු වන්නේ ඇමරිකානු චිත්‍රපට කර්මාන්තයේ ම ඉතිහාසය දෙස හැරී බැලීම පමනි. හාසයොත්පාදනය පිලිබඳ සුධීමතෙක් හා මුල් පෙලේ සමාජ විවේචකයෙක් වූ චාලි චැප්ලින්ගේ චිත්‍රපට නැරඹීමට නරඹන්නෝ රැස්කමින් පැමිනියහ. දෙවනුවට කී සමාජ විවේචක ගුනය චැප්ලින්ගේ ආශ්චර්යජනක සාර්ථකත්වයට ආගන්තුක වූවක් නො වීය. ඕසන් වෙලස්, ජෝන් ෆෝඩ්, ඇල්ෆ්‍රඩ් හිච්කොක්, හොවාඩ් හෝක්ස් යන සෑම පුද්ගලයෙක් ම තමන්ගේ ම හැකියාවන්ගේ සහ දෘෂ්ටීන්ගේ සීමාවන් තුල ජනප්‍රිය විනෝදජනක නිර්මානයන් කල අතර ඊනියා ජනප්‍රියත්වය වෙනුවෙන් තම කෞශල්‍යය පාවා නො දුන්හ.

වරද ඇත්තේ ජනතාවගේ නොව පරිහානිගත, ව්‍යාජ හා හිස් සංස්කෘතියේ ය.

සංගත පාලනය සහ මුදලේ බලය විසින් අනවනු ලබන බලහත්කාරයන්ගේ තතු යටතේ, එසේත් නැතහොත් (ප්‍රගාඪ වසයෙන් පවා) ඕනෑම කාල පරිච්ඡේදයක ආධිපත්‍යධාරී අදහස් වනාහි පාලක පන්තියේ අදහස් නිසා චිත්‍රපට තැනීමේ හා රූපවාහිනියේ වර්තමාන තත්වය වෙනස් කිරීමට කිසිවක් කල නො හැකි යයි ද 'රැඩිකල්ලු' අපට කියති.

චිත්‍රපට හා රූපවාහිනී කර්මාන්තවල පවත්නා සබඳතා දරාගත නො හැකි වන අතර ඒවා කර්මාන්තයේ රැකියාවල නියුක්ත වන්නන්ට ශිෂ්ට සම්පන්න කොන්දේසි ඇති කිරීම සහ ඔවුන්ගේ අවංක කලාත්මක වැඩ කටයුතු සමග නො පෑහේ. එබැවින් එම සබඳතා පරිවර්තනය කරනු ලැබිය යුතු ය. එය වනාහි කම්කරු පන්තියේ හා සමාජවාදී ව්‍යාපාරයේ කර්තව්‍යය යි. එසේ වුවත් එය යමෙකුට අත් පොරවාගෙන බලා සිටීම සඳහා ඉදිරිපත් කල හැකි නිදහසට කාරනාවක් නො වේ.

පනවන ලද වාරනය හෝ ස්වයං-වාරනය පවත්නා සෑම තැනක දී ම එයට හෙලි දරවු කොට එයට එරෙහිව සටන් වැදිය යුතු ය. වර්තමානයේ දී පවත්නා සීමාසහිතකම්වලට එරෙහිව පෘථුල ප්‍රයත්න දැරීමක් අපි නො දකිමු. ඒ වෙනුවට අපට දැක ගන්නට ලැබෙන්නේ එම සීමාසහිතකම්වලට ඕනෑවටත් වඩා අනුගත වීමකි.

තම ප්‍රේක්ෂකයන්ට හා ශ්‍රාවකයන්ට කීමට යමක් ඇති අයට සම්පත් හා අවස්ථාවන් තිබේ. අද්‍යතන යථාර්ථයන් සමග පෙලගැසෙන, ගැඹුරු ලෙස සිතන සහ හඟින හා ඔවුන් වෙනුවෙන් කතා කිරීමට ප්‍රධාන

ධාරාවේ කිසිවෙක් නැති මහා ජනකායන්ගේ දැවෙන ගැටලුවලට ආමන්ත්‍රනය කරන කලාකරුවන්ට ප්‍රේක්ෂකයක් සොයා ගත හැකි වනු ඇත. එමෙන් ම එම කලාකරුවන්ට අධිකාරයන් සමග අරගලයන් පවතීනම් ඒවා ම ත් මහජන මාවත වනු ඇත. වර්තමාන ඇමරිකාවේ කලාකරුවන් කී දෙනෙකුට තමන් සත්‍යය වෙනුවෙන් සංතෘප්ත මහජන මතයේ පීඩනය ප්‍රතික්ෂේප කර ඇතැයි කිව හැකි ද? එලෙස කිව හැකි සෑහෙන පිරිසක් නැත.

අපගේ දෘෂ්ටියට අනුව ප්‍රමුඛ දෙය වන්නේ කීමට වැදගත් දෙයක් අතැතිව වැඩට බසින ලෙස යි. එවිට උපායන් හා මූලෝපායන් සොයා ගත හැකි වනු ඇත.

වර්තමාන වැඩ වර්ජනය වඩාත් හිතන මතන ලේඛකයන් හා අනෙකුත් අය මෙහි සඳහන් කරන ලද දිශාවට යොමු කරනු ඇතැයි අපගේ බලාපෙරොත්තුව යි

© www.wsws.org